## වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - 2016

------------------------------------------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

#### 2.2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය | පාලක සභා රැස්වීම් සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙකු හා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපතිවරයා සාමාජිකත්වය දැරිය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී පවත්වන ලද රැස්වීම් 11 කින්, මුදල් අමාත්‍යාංශයෙන් නම් කළ නිලධාරියා රැස්වීම් 09 ක් සඳහා ද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපතිවරයා රැස්වීම් 08 ක් සඳහා ද සහභාගී වී නොතිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණවල ඵලදායකත්වය පිළිබඳව විගණනයේ දී සෑහීමට පත්වීමට නොහැකි විය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 2010 දෙසැම්බර් 31 දිනට පැවති හිමිකම් නොපෑ එකතුව රු. 1,266,275 ක් වූ පුස්තකාල, විද්‍යාගාර හා නේවාසිකාගාර තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2013 ඔක්තෝබර් 24 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2013/2014 (ii) චක්‍රලේඛය | විදේශ පුහුණු වැඩසටහනක් සම්පූර්ණ කල සියළුම නිලධාරීන් සහභාගී වූ වැඩසටහන පිළිබඳ වාර්තාවක් මාසයක් ඇතුළත ආයතන ප්‍රධානියාට ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණ ද 2013 වර්ෂයේ සිට විදේශ ගත වූ නිලධාරීන් 21 දෙනෙකුගෙන් 18 දෙනෙකු එවැනි වාර්තා ලබා දී නොතිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

-------------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 214,709 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,054,300 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,269,009 ක වර්ධනයක් ඇති වී තිබුණි. සේවක පිරිවැය රු.16,552,372 කින් වැඩිවී නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ප්‍රදාන රු.7,147,326 කින් අඩුවුවද වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන රු. 27,787,500 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ ඌනතාවය 2013 වර්ෂයේදී සැලකිය යුතු අතිරික්තයක් බවට පත්වී 2014 වර්ෂය වනවිට  අතිරික්තය අඩුවී තිබුණු අතර 2015 වර්ෂයේ ඌනතාවයක් හා සමාලෝචිත වර්ෂයේ නැවත අතිරික්තයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු. 139,569,752 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු. 216,650,852 ක් වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------------

4.1 **කාර්යසාධනය**

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා සුදුසුකම් ලබාගත් අය වෙත උසස් අධ්‍යාපන අවස්ථාවන්  ලබා දීම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණයි. එසේම තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සඳහා විෂයමාලා සංවර්ධනය කිරීම සඳහා දායක වීම, විශ්වවිද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා පිළිගත හැකි සුදුසුකම් ලැබූ මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරීන් සඳහා අධ්‍යයන පාඨමාලා සැපයීම, ජාතික වෘත්තීය සුදුසුකම්ලත් අයට ඔවුන්ගේ නිපුණතා උසස් කිරීම සඳහා අවශ්‍ය පාඨමාලා ඉදිරිපත් කිරීම හා අඛණ්ඩ වෘත්තීමය සංවර්ධනය සඳහා ව්‍යාප්ති පාඨමාලා ඉදිරිපත් කිරීම ද අරමුණු වේ. එකී අරමුණු ඉටුකර ගැනීමට අදාලව පාඨමාලා සඳහා තත්ත්ව සහතික ලබාගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතෙහි 21(I) වගන්තියට අනුව ඇතුලත් කිරීම, ප්‍රතීතනය  කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාව පිහිටුවා තිබූ අතර එම සභාවේ 2010 මැයි 18 දිනැති තීරණය ප්‍රකාරව විශ්වවිද්‍යාලය පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් හා අනෙකුත් පාඨමාලා සඳහා මොරටුව, පේරාදෙණිය හා කොළඹ විශ්වවිද්‍යාල මගින් ප්‍රතීතනයන් ලබා ගැනීමටත් ඊට අමතරව විදේශීය පිලිගත් විශ්වවිද්‍යාලවලින් ප්‍රතීතනයන් ලබාගැනීමටත් තීරණය කර තිබුණි. කෙසේවුවද විශ්වවිද්‍යාලය පිහිටුවා වර්ෂ 07 ක කාලයක් ගත වී තිබුණ ද අපේක්ෂිත පරිදි උපාධි පාඨමාලාවල ප්‍රතීතනයන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (SSDP) යටතේ විශ්වවිද්‍යාලය පවත්වාගෙන යන පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හා දේශීය, විදේශීය වෘත්තීමය ආයතනවලින් ප්‍රතීතනය ලබාගැනීමට 2015 හා 2016 වර්ෂ සඳහා පිළිවෙලින් රු. 50,000 ක් හා රු. 500,000 ක් වශයෙන් ප්‍රතිපාදන ලබාදී තිබුණද විගණිත දිනය වූ 2017 මාර්තු 02 දින වන විටත් ප්‍රතීතනයන් ලබාගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත්වී තිබුණි.

(iii) 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතෙහි 21 (ආ) (II) වගන්තියට අනුව විශ්වවිද්‍යාලයට ඇතුලත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාවට ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය හෝ ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය නියෝජනය කිරීම සඳහා පත් කරන ලද "පත් කළ සාමාජිකයන්" අතුරින් අවම වශයෙන් එක් අයෙකු හෝ ඇතුළත් වන පරිදි පාලක මණ්ඩලය විසින් නම් කරනු ලබන පාලක මණ්ඩලයේ නියෝජිතයන් දෙදෙනෙකු ඇතුළත් විය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද තත්ත්ව සහතික සභා රැස්වීමට මණ්ඩලයෙන් එක් නියෝජිතයෙක් පමණක් ඇතුළත් වී තිබුණි.

(ආ) **උපාධි පාඨමාලා පැවැත්වීම**

-------------------------------

(i) උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම ආරම්භ කළ 2010 වර්ෂයේ දී හා 2012 වර්ෂයේ දී පූර්ණ කාලීන පාඨමාලා පිළිවෙලින් 07ක් හා 08 ක් සඳහා සිසුන් බඳවාගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය වන විට ඉන් පාඨමාලා 05 ක් වෙනුවෙන් පමණක් සිසුන් බඳවා ගෙන තිබුණු අතර අනෙකුත් පාඨමාලා සඳහා සිසුන් බඳවා ගෙන නොතිබුණි.

(ii) 2013 වර්ෂයේ සිට පූර්ණ කාලීන පාඨමාලා වලට අමතරව සති අන්ත පාඨමාලා (අර්ධකාලීන) වෙනුවෙන් ද සිසුන් බඳවා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විට පූර්ණ කාලීන පාඨමාලා 05ක් වෙනුවෙන් සිසුන් 122 දෙනෙකු ද සති අන්ත පාඨමාලා 13ක් වෙනුවෙන් සිසුන් 462 දෙනෙකු බඳවාගෙන තිබූ අතර පූර්ණ කාලීන පාඨමාලා සඳහා නව පාඨමාලා හඳුන්වා දී සම්පත් උපරිම අයුරින් භාවිතා කළ හැකිවන පරිදි සිසුන් බඳවා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(iii) එක් එක් පාඨමාලාව සඳහා බඳවා ගතහැකි අවම සිසුන් සංඛ්‍යාව හෝ බඳවා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද පාඨමාලා 09 ක සිසුන් බඳවාගැනීම වෙන් වෙන්ව සැලකීමේදී සිසුන් බඳවා නොගැනීම සියයට 23 සිට සියයට 100 ක අවම මට්ටමක පැවතුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයට බඳවාගත් සිසුන්ගේ පාඨමාලා හැරයාමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. ඒ අනුව පාඨමාලා 11 ක් සඳහා බඳවාගත් සිසුන් 342 දෙනෙකුගෙන් සිසුන් 98 දෙනෙකු වර්ෂය තුල පාඨමාලා හැර ගොස් තිබුණු අතර පාඨමාලා වෙන් වෙන්ව සැලකීමේදී පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය සියයට 12 සිට සියයට 67 දක්වා වූ පරාසයක පැවතුණි. මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) **ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම**

-------------------------------------

විශ්වවිද්‍යාලය විසින් 2012 වර්ෂයේ සිට මේ දක්වා පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලා සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතට අනුව විශ්වවිද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා පිළිගත හැකි සුදුසුකම් ඇති මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරීන් සඳහා අධ්‍යයන පාඨමාලා සැපයීම විශ්වවිද්‍යාලයේ අරමුණක් වුවද ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් පවත්වනු ලබන ඩිප්ලෝමා පාඨමාලාව (National Diploma in Technical Teacher Education) හැර වෙනත් ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2015 වර්ෂයේ සිසුන් බඳවා ගෙන නොතිබුණු අතර 2016 වර්ෂය වෙනුවෙන් කිසිදු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා සිසුන් බඳවා ගෙන නොතිබුණි.

(ii) විශ්වවිද්‍යාලය මගින් 2013 වර්ෂයේ පවත්වනු ලැබූ ජාතික වෘත්තීය සුදුසුකම 05 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා 02 ක් සඳහා එම ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) 2016 වර්ෂය අවසානය වනවිටත් ලබාගැනීමට කටයුතු කර නොතිබීමෙන් පාඨමාලා හැදෑරූ සිසුන් වෙත ගුණාත්මකභාවයෙන් යුත් පාඨමාලා ලබාදීමට විශ්වවිද්‍යාලය අපොහොසත්වී තිබුණි.

(iii) ඩිප්ලෝමා පාඨමාලා සමත් සිසුන් පිළිබඳ පරීක්ෂාවේදී පාඨමාලා 03 ක් හැර අනෙකුත් පාඨමාලා සමත් වීමේ ප්‍රතිශතය අවම මට්ටමක පැවති අතර එය සියයට 07 සිට සියයට 47 දක්වා වූ පරාසයක පැවතිණි. එම පාඨමාලාවලින් අසමත් වන සිසුන් සම්බන්ධයෙන් නැවත විභාග පැවැත්වීමේ දීර්ඝ ප්‍රමාදයක් පැවති අතර පාඨමාලා අඛණ්ඩව පවත්වා නොතිබීම මීට හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) **නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (SSDP) ක්‍රියාත්මක කිරීම**

වෘත්තිය පුහුණු ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක වන නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ 2016 වර්ෂය වෙනුවෙන් විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් 10 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 254.2 ක් වෙන් කර තිබුණු අතර විශ්වවිද්‍යාලය ඉන් ක්‍රියාකාරකම් 08 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 157.4 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව විශ්වවිද්‍යාල විද්‍යායතන පිහිටුවීම හා NVQ 5,6 මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් (Establish private and PPP university colleges to offer demand – driven NVQ 5,6 level training programs) සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 01 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද, අදාළ කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ii) පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතන වල කාර්ය මණ්ඩලය ද ඇතුලත්ව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 17 දෙනෙකු සඳහා රු. මිලියන 17 ක මුදලක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ දී, කිසිදු නිලධාරියෙකුට පශ්චාත් උපාධි සුදුසුකම් සඳහා මූල්‍ය සහාය ලබාදී නොතිබුණු අතර එම මුදලින් පසුගිය වර්ෂයේ ප්‍රතිපාදන ලබාදී තිබූ නිලධාරීන් 05 දෙනා වෙනුවෙන් රු. මිලියන 10.7 ක් වැය කර තිබුණි.

(iii) ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) 5 සඳහා තෘතීය හා අධ්‍යාපනික පුහුණුව (NVQ 5 for TVET Trainer) ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 06 ක් වෙන්කර තිබුණ ද, ඉන් රු. මිලියන 4.94ක් වැය කර තිබුණේ 2015 වර්ෂයේ බඳවා ගත් පුහුණු ලාභීන් 238 දෙනෙකු වෙනුවෙනි. 2016 වර්ෂය තුළදී පුහුණු ලාභීන් බඳවා ගැනීමක් සිදු කර නොතිබුණි.

(iv) පිළිගත් විශ්වවිද්‍යාලවල මඟපෙන්වීම් යටතේ විෂයමාලා සංවර්ධනය (Develop Curricula with Industry Inputs and Guidance from Reputed Universities) කිරීම වෙනුවෙන් ප්‍රතිපාදිත රු. මිලියන 01ක මුදලින් රු.මිලියන 0.39 ක් වැය කර හෝටල් කළමනාකරණ උපාධි පාඨමාලාව පමණක් සංවර්ධනය කර තිබුණි.

(v) විශ්වවිද්‍යාල විද්‍යායතනවල අධ්‍යයන හා පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම (Establish mechanism to monitor academic and administrative quality in university colleges) වෙනුවෙන් ප්‍රතිපාදිත රු. මිලියන 5.5ක මුදලින් රු. මිලියන 5.496 ක් වැයකර විශ්වවිද්‍යාලය සඳහා Video Conference system ක් ලබාගෙන තිබුණ ද විශ්වවිද්‍යාලය යටතේ පවත්නා විද්‍යායතනවල එවැනි පද්ධති සවිකර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. අමාත්‍යාංශයේ හා විද්‍යායතනයන්හි Video Conference system සඳහා වර්ෂය තුල ප්‍රතිපාදිත රු. මිලියන 20 උපයෝජනය කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

විශ්වවිද්‍යාලය සඳහා 2015 වර්ෂයේ සකස් කරන ලද ආයතන සංග්‍රහය සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### (අ) උපාධි පාඨමාලා සඳහා බාහිර දේශකයින් පත් කිරීම

වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ 2011 වර්ෂයේ සිට බාහිර දේශකයින් වෙනුවෙන් කරන ලද වියදම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කරන ලද සුදුසුකම් සපුරා නොතිබූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකුට 2010 අගෝස්තු 09 සිට වර්ෂ 01 මාස 09 දින 22ක කාලපරිච්ඡේදයක් සඳහා පශ්චාත් අධ්‍යයන කටයුතු වෙනුවෙන් විදේශ ශිෂ්‍යත්ව එකවර පිරිනමා තිබුණි. ඒ හේතුවෙන් එම කාලපරිච්ඡේදය තුල විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම සඳහා බාහිර දේශක වියදම් ලෙස 2011 හා 2012 වර්ෂවලදී පිළිවෙලින් රු. 2,799,119 ක හා රු. 5,210,428 ක අමතර පිරිවැයක් දැරීමට විශ්වවිද්‍යාලයට සිදු වී තිබුණි.

(ii) 2013 වර්ෂයේ දී කථිකාචාර්ය (ආධුනික) තනතුර වෙනුවෙන් 17 දෙනෙකු සඳහා උසස්වීම් ලබා දී තිබුණ ද එම වර්ෂයේ දී බාහිර දේශක වියදම රු.8,043,300 ක ඉහළ අගයක් ගෙන තිබුණු අතර එය පෙර වර්ෂයේ බාහිර දේශක ගෙවීම වූ රු. 5,210,428 සමඟ සැසඳීමේදී සියයට 54 ක වැඩිවීමකි.

(iii) සමාලෝචිත වර්ෂයේදී උපාධි පාඨමාලා සඳහා බාහිර දේශකයින්ගේ දායකත්වය එක් එක් උපාධි පාඨමාලා සඳහා නිර්දේශිත මුළු දේශන පැය ගණනින් සියයට 55 ක් විය. වර්ෂය තුළ බාහිර දේශක ගෙවීම් ලෙස රු. 17,266,578 ක් දැරීමට විශ්වවිද්‍යාලයට සිදුව තිබුණු අතර එය 2015 වර්ෂයට සාපේක්ෂව රු. 6,874,366 ක වැඩිවීමකි. ඒ අනුව විශ්වවිද්‍යාලය පවත්වනු ලබන පාඨමාලාවන් සඳහා විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය අවම මට්ටමක පැවතුණි.

(ආ) "ශ්‍රී ලංකාවෙහි විශ්වවිද්‍යාල පද්ධතියෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වන ආචාරධර්ම හා අධ්‍යයන වගවීම" මැයෙන් 2015 මැයි 07 දිනැති අංක UGC/AC/QA/Gen දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා විශ්වවිද්‍යාලය තුල ආචාර ධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණු බැවින්, එමගින් අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් වඩා කාර්යක්ෂම හා ඵලදායී දායකත්වයක් ලබාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ඇ) **පර්යේෂණ දීමනා ගෙවීම**

(i) 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 4(ii) ඡේදය ප්‍රකාරව පර්යේෂණ වාර්තාවෙහි ප්‍රගතිය දක්වමින් පර්යේෂණ කටයුතු ආරම්භ කළ දින සිට මාස 6 ක් ඇතුලත කමිටුව වෙත අතුරු වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, නිලධාරීන් එසේ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) පර්යේෂණයන් සිදුකිරීම වෙනුවෙන් නිලධාරියෙකු වෙත 2015 වර්ෂයේ මාර්තු සිට 2016 සැප්තැම්බර් දක්වා පර්යේෂණ දීමනා ලෙස රු. 469,523 ක් ගෙවා තිබුණ ද 2017 අගෝස්තු 27 දින වන විටත් ඉහත චක්‍රලේඛයේ 4(iii) ඡේදය ප්‍රකාරව අවසාන පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද මෙම නිලධාරියා 2016 සැප්තැම්බර් 13 දින විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත්ව ගොස් තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

විශ්වවිද්‍යාලය සතු අධ්‍යක්ෂ ජනරාල් නිල නිවස 2012 නොවැම්බර් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**4.5 කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීම, ආයතනයේ ධාරිතාව වැඩිකිරීම, ඉගෙනුම් පරිසරය හා පශ්චාත් උපාධි පැවැත්වීම අරමුණු කර ගනිමින් උපකරණ සඳහා රු. මිලියන 150 ක් ද ඇතුළත්ව රු. මිලියන 359.9 ක පිරිවැයකට ඉදිකිරීමට යෝජිතව තිබූ ඉගෙනුම් සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය (Learning Resources Development Centre) සඳහා මූලික වශයෙන් 2011 වර්ෂයේදී රු. මිලියන 17.9 ක් හා ඉතිරි මුදල් 2012 වර්ෂයේ සිට වර්ෂ 03 ක් දක්වා වාර්ෂිකව ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් ලබාදීමටත් අනුමැතිය ලැබී තිබුණි. එම ප්‍රතිපාදන ඇතුලත මුදල් කළමනාකරණය කර ගනිමින් ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සිදුකල යුතු බවට අංක. අමප/11/2152/539/017-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දන්වා තිබුණි. 2016 වර්ෂය අවසානය වනවිට ඉදිකිරීම් වෙනුවෙන් රු. මිලියන 206.5 ක් වැයකර තිබුණද අනුමත ප්‍රතිපාදනය ඉක්ම වූ රු. මිලියන 75 ක මැදිරි සංකීර්ණයේ අතිරේක වැඩ සඳහා වූ වියදම සඳහා කැබිනට් අනුමැතිය නොලැබීම හේතුවෙන් 2016 වර්ෂය තුල ඉදිකිරීම් කටයුතු කළ නොහැකි වී තිබුණි. කෙසේ වුවද නිසි සැලසුමකින් හා කාර්යක්ෂමතාවයකින් යුක්තව කටයුතු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වී තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 ජුලි 27 දිනැති අංක. DMS/E4/47/2/280/1 දරන ලිපියට පටහැනිව 2012 ඔක්තෝබර් 12 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට කාර්ය මණ්ඩල අන්තර්ග්‍රහණය කිරීමේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව තනතුරට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබිය දී දරන්නාට පෞද්ගලික වන සේ තනතුරු වල පිහිටුවා තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා නොතිබුණි. එසේම ඉන් කථිකාචාර්යවරුන් 05 දෙනෙකුගේ පවත්නා සුදුසුකම් අදාල විශ්වවිද්‍යාල වලින් සනාථ කර ගෙන නොතිබුණි.

(ආ) දරන්නාට පුද්ගලික වනසේ ජ්‍යෙෂ්ඨ ගුරු සහකාර තනතුරේ පිහිටුවා තිබුණු කථිකාචාර්යවරයෙකු කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ විදේශ ශිෂ්‍යත්වයක් ලැබ පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදැරීම සඳහා තායිලන්තයට ගොස් තිබුණද, නියමිත කාලය තුළ උපාධිය සම්පූර්ණ කර නොතිබුණු අතර එම ශිෂ්‍යත්වය වෙනුවෙන් වැයකල රු. 3,876,544 ක් හා අතිරේක අධ්‍යයන වියදම් ලෙස බාත් 154,503.43 ක් (රු. 34,170) අයකරවා ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොතිබියදී හා පවත්නා සුදුසුකම් අදාළ විශ්වවිද්‍යාල මගින් තහවුරු කර ගැනීමකින් තොරව ගුරු සහකාර නිලධාරියෙකු 2013 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තොරතුරු තාක්ෂණ අංශයෙහි කථිකාචාර්ය (ආධුනික) තනතුරට පත්කර තිබුණි.

(ඈ) ඉන්දියාවෙහි විශ්වවිද්‍යාලයක වර්ෂ දෙකක පශ්චාත් උපාධිය සම්පූර්ණ කර තිබුණු කථිකාචාර්යවරයෙකුගේ උපාධියේ හා ප්‍රතිඵලවල වලංගුතාවය එම විශ්වවිද්‍යාලයෙන් තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ අනුමත බඳවාගැනීමේ පටිපාටියෙහි 5.4 (i) ඡේදයට අනුව අධ්‍යයන කාණ්ඩයට අයත් තනතුරුවලට බඳවා ගැනීමේ දී හා උසස් කිරීමේ දී එම පරිපාටියට අනුකූල විය යුතු බව දක්වා තිබියදී ඊට පටහැනිව ගොඩනැගිලි සේවා තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී පාඨමාලාව සඳහා පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු කථිකාචාර්යවරියක 2016 ජුනි 01 දින සිට කථිකාචාර්ය (ආධුනික) තනතුරට බඳවාගෙන තිබුණි.

(ඊ) සහකාර මූල්‍යාධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියේ 5.4.1 ඡේදය අනුව, පවත්නා පුරප්පාඩු වලින් සියයට 60 ක් බාහිර අයදුම්කරුවන් වෙතින් බඳවා ගැනීම් සිදුකල යුතු වුවද, ඊට පටහැනිව අනුමත කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු තනතුරු 3 සඳහා අභ්‍යන්තර නිලධාරීන් බඳවාගෙන තිබුණි.

(උ) අධ්‍යක්ෂ පත්කිරීම (ඇතුලත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීම)

(i) 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතෙහි 16(1) වගන්තියට අනුව විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ (ඇතුලත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීම) තනතුරට පත්කිරීමේ දී තේරීම් කමිටුවක නිර්දේශය මත පූර්ණ කාලීන නිලධරයෙකු වශයෙන් පාලක මණ්ඩලය විසින් පත්කරනු ලැබිය යුතුය. එහෙත්, ඊට පටහැනිව 2014 අගෝස්තු 28 දිනැති අංක UNIVOTEC/AC/SAL/112 දරන ලිපිය මගින් 2014 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 03 ක

කාලපරිච්ඡේදයක් සඳහා තනතුර දරන්නාට පුද්ගලික වන සේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II තනතුරක කථිකාචාර්යවරයෙකුට දැනට දරන තනතුරට අතිරේක වශයෙන් විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ තනතුරෙහි පත්වීම් ලබාදී තිබුණි. එසේම තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය 2016 වර්ෂය අවසානය වනවිටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයෙහි 13.1 (අ) වගන්තියට අනුව නිලධාරියෙකුට අතිරේක තනතුරක පූර්ණ රාජකාරී ඉටුකිරීමට හෝ එක් තනතුරකට වැඩි තනතුරු ගණනක රාජකාරී ඉටුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද ඊට පටහැනිව විශ්වවිද්‍යාලය පූර්ණ කාලීනව ක්‍රියා කල යුතු කථිකාචාර්ය හා අධ්‍යක්ෂ යන තනතුරු 2 ක කාර්යයන් එක් නිලධාරියෙකු වෙත පවරා තිබුණි. ඒ අනුව කථිකාචාර්ය තනතුරෙහි වැටුප් හා දීමනා වලට අමතරව අධ්‍යක්ෂ තනතුරෙහි පත්වීම් ලද 2014 සැප්තැම්බර් සිට එම තනතුරට අදාල වරප්‍රසාදයක් වන වාහන සහ ඉන්ධන දීමනා ගෙවා තිබුණු අතර විගණිත දිනය වූ 2017 අප්‍රේල් දක්වා එසේ ගෙවූ මුදල රු. 942,180 ක් විය.

(ආ) රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය සඳහා වැඩබලන අධ්‍යක්ෂවරයෙකු පත්කිරීම

(i) ආයතන සංග්‍රහයෙහි II පරිච්ඡේදයෙහි 13.1.2 හා 13.4 වගන්තීන්ට අනුව වැඩ බැලීමේ පත්වීමක් සඳහා පත් කරනු ලබන නිලධාරියාට අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව පත්කිරීම සඳහා සෑම අතින්ම සුදුසුකම් තිබිය යුතුය. කෙසේ වුවද අධ්‍යක්ෂ තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණු විශ්වවිද්‍යාලයේ දරන්නාට පුද්ගලික වනසේ කථිකාචාර්ය II තනතුරෙහි පිහිටුවා තිබූ කථිකාචාර්යවරයෙකු 2016 ජූලි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යායතනයේ වැඩබලන අධ්‍යක්ෂ තනතුරට පත්කර තිබුණු අතර වැඩ බැලීමේ වැටුප් සහ ඉන්ධන දීමනා වශයෙන් විද්‍යායතනය විසින් ගෙවා තිබූ මුදල රු. 179,100 ක් විය.

(ii) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.3.1 (vi) ඡේදයට අනුව වැඩ බැලීමේ පත්වීමක් නිශ්චිත නොවූ කාලපරිච්ඡේදයක් සඳහා පත් නොකල යුතු බව දක්වා තිබිය දී, 2016 ජූලි 14 දිනැති අංක UVT/Admin/SAL/111 දරන පත්වීමේ ලිපියට අනුව ඉදිරි අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා පත්වීම් ලබා දී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබූ අතර අභ්‍යන්තර විගණක හා ලිපිකරු ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2011 දෙසැම්බර් 23 දිනැති අංක DMA/ADM/2011/1-26 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට හා මුදල් රෙගුලාසි 133 (2) (අ) (i) කෙරෙහි අවධානය යොමු කර විශ්වවිද්‍යාලයේ හා විද්‍යායතනවල ඉලක්ක සාක්ෂාත් කර ගැනීම, කාර්ය සාධනය, ගිණුම්කරණ, මූල්‍ය හා මෙහෙයුම් අංශයන්හි අභ්‍යන්තර පාලන ඇගයීම් වැනි ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සැලසුම් කර නොතිබුණි.

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණන සැලැස්මට අනුව ආවරණය කිරීමට අපේක්ෂිතව තිබූ ක්ෂේත්‍ර 14 ක් අතුරින් විගණිත ක්ෂේත්‍ර 02කට අදාළව වර්ෂය තුළ විගණන වාර්තා 11ක් නිකුත් කර තිබුණ ද ඉන් වාර්තා 05ක් පුද්ගල වැටුප් තීරණය කිරීමට අදාලව නිකුත් කර තිබුණි.

(ආ) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය යටතේ ආරම්භ කල විශ්වවිද්‍යාල විද්‍යායතන 06හි අභ්‍යන්තර විගණන කාර්යයන්හි වගකීම මෙම අංශය වෙත පැවරී තිබුණද, විද්‍යායතන සම්බන්ධයෙන් අඛණ්ඩ විගණනයක් සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය පමණක් විගණනය කර වාර්තාවක් නිකුත් කර තිබුණි.

## 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව විගණන වාර්තාව සමඟ වාර්ෂික අවසාන ගිණුම් ඇතුලත් වාර්ෂික වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත් විශ්වවිද්‍යාලයේ 2015 ගිණුම් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මූල්‍ය පාලනය | නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා නොකිරීම. |
| (ආ) | ගබඩා පාලනය | නිලධාරීන් වෙත භාණ්ඩ නිකුත් කිරීමේ දී නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | නිලධාරීන්ගේ සුදුසුකම් අදාල ආයතනවලින් /විශ්වවිද්‍යාලවලින් සනාථ කරවාගෙන නොතිබීම, බඳවාගැනීමේ පරිපාටිය අනුව කටයුතු නොකිරීම. |
| (ඈ) | පාඨමාලා පැවැත්වීම | ප්‍රශස්ථ ධාරිතාවයෙන් පාඨමාලා නොපැවැත්වීම හා දේශකවරුන්ගේ කාර්යසාධන ඇගයීම් නොකිරීම. |
| (ඉ) | අභ්‍යන්තර පාලනය | නිලධාරීන් අතර නිසි වැඩ බෙදීමක් නොමැති වීම, බැහැර යාමේ ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම. |